මගේ අංකය - CSD/03/03/14 චක්‍රලේඛ අංක - 14/2015

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
අංක 23, දුම්රියපල පාර
බම්බලපිටිය.
2015-11-10

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියලුම අධ්‍යක්ෂවරුන්/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්,
සියලුම අංශ භාර නිලධාරීන්,
සියලුම බලකා භාර අණදෙන නිලධාරීන්/ පුහුණු කඳවුරු භාර අණදෙන නිලධාරීන්,
හා ව්‍යාපෘති භාර නිලධාරීන් වෙත.

__විනය විරෝධී හැසිරීම මත සිදුවන වැරදි සම්බන්ධව කටයුතු කිරීම__

සිවිල් ආරක්ෂක සාමාජිකයින්ගේ විනය විරෝධී හැසිරීම මත සිදුවන වැරදි සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී බලකා / පුහුණු පාසල් අණදෙන නිලධාරීන් විසින් පහත උපදෙස් අනුගමනය කළ යුතුය. (උප බලකා/ ව්‍යාපෘතිවලට අනුයුක්ත සාමාජිකයින් සම්බන්ධයෙන් අදාල අණභාර නිලධාරීන් විසින් තම ආසන්නතම බලධාරියා වෙත වාර්තා කළ යුතුය).

01. අත්අඩංගුවට පත්වීම සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග

01.1 දිනකට අඩු කාලයක් පොලිස් අත්අඩංගුවට පත්ව සිට නිවැරදිකරුවකු ලෙස නිදහස් වන්නන් සම්බන්ධයෙන් අදාල අණදෙන නිලධාරීන් විසින් මූලික විමර්ශනයක් සිදුකොට සුදුසු පරිදි ක්‍රියා කළ යුතුය.

01.2 දිනකට වැඩි කාලයක් පොලිස් අත්අඩංගුවට පත්ව රක්ෂිත බන්ධනාගාර ගතව සිට ඇප මත නිදහස් වන පුද්ගලයින් සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා අදාල පුද්ගලයාට විරුද්ධව චෝදනා නැගීමට තරම් ප්‍රමාණවත් හේතු සාධක ඇති බව ඒ මූලික විමර්ශනය මගින් බැලූ බැල්මට පෙනී යන්නේ නම් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ 5 වන පරිශිෂ්ඨය(ඇමුණුම 1) ප්‍රකාරව චෝදනා පත්‍රයක් සකස් කර විනය බලධරයා වන අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය. ඒ අනුව කරුණු සලකා බැලීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල් විසින් එම චෝදනා පත්‍රය සැකකරු වෙත නිකුත් කරනු ඇත. ඊට ඔහු විසින් ලබාදෙන පිළිතුර සහ අදාල වෙනත් ලියකියවිලි සමඟ සේවය ලබාදීම හෝ වැඩ තහනම් කිරීම පිළිබඳ නිර්දේශ අධ්‍යක්ෂ(පිරිස් පාලන) මගින් ඉදිරි කටයුතු සඳහා අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

01.2.1 නියමිත කාලසීමාව තුළදී තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සිතාමතා පැහැර හරින හෝ චූදිතයකු සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා සිදුකරන ලද වරදට අදාලව ඇති සියලුම සාක්ෂි සමඟ ලියකියවිලි අධ්‍යක්ෂ(පිරිස් පාලන) මගින් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීමට කටයුතු කළ යුතු වේ.

01.3 උසාවියක් මගින් නඩු කටයුත්තක් අවසානයේදී නිදොස් කොට නිදහස් කරන ලද පුද්ගලයෙකුට අදාලව පෞද්ගලිකව විමර්ශනයක් පවත්වා සත්‍ය ලෙසම සිද්ධිය පිළිබඳව දැනුවත් වී අදාල පුද්ගලයා සම්බන්ධයෙන් කටයුතු කිරීමට වගබලා ගත යුතුය.

01.4 උසාවියක් මගින් නඩු කටයුත්තක් අවසානයේදී වරදකරුවෙකු කර දඬුවම් නියම කරන ලද පුද්ගලයෙකු සම්බන්ධයෙන් අදාල නඩු වාර්තා සහ උසාවි නියෝගයේ පිටපත් සහ වරදට අදාල වෙනත් සාක්ෂි අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතුය.

**02. ඉහත දක්වන ලද අවස්ථාවන්ට අදාල නොවන අවස්ථාවලදී පහත දක්වා ඇති ආකාරයට කටයුතු කිරීම යෝග්‍ය වේ.**

02.1 ආයතන සංග්‍රහය II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයෙහි සඳහන් රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධ පළමු වන උපලේඛනය යටතට ගැනෙන වරදවල් සිදුකරන ලද සිවිල් ආරක්ෂක සාමාජිකයින් සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කොට ඊට අදාල සියළුම ලිඛිත හා පුද්ගල ප්‍රකාශ සමඟ විමර්ශන වාර්තාව වියිමත් විනය පරීක්ෂණයක් සිදු කොට නිසි පරිදි කටයුතු කිරීම සඳහා අධ්‍යක්ෂ(පිරිස් පාලන) මගින් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුය. සිදුකරන ලද වරද

සම්බන්ධයෙන් වාර්තා වී සතියක් තුළ මෙම කටයුතු අවසන් කළ යුතුය. (පළමු උපලේඛනය - ඇමුණුම 2)

02.2 ආයතන සංග්‍රහය II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ සඳහන් රාජ්‍ය නිලධාරීන් විසින් සිදු කළ හැකි වරදවල් සම්බන්ධයෙන් දෙවන උපලේඛනය(ඇමුණුම 3) යටතට ගැනෙන වරදවල් පිළිබඳව කටයුතු කිරීමේදී සිදුකරන ලද වරදට අදාල තොරතුරු වාර්තා වී සති 02 ක් ඇතුලත මූලික විමර්ශනයක් සිදුකිරීම මගින් හෝ පහත දක්වා ඇති ආකාරයට කටයුතු කර සුදුසු පරිදි ක්‍රියාමාර්ග ගත යුතුය.

02.2.1 මෙම ක්‍රියාමාර්ග අනුගමනය කළ යුත්තේ විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීමට තරම් බරපතල විෂමාචාරයක් නොවන අවස්ථාවලදී පමණි.

02.2.2 සිදුකර ඇති විෂමාචාරය සම්බන්ධයෙන් අදාල පුද්ගලයා වෙත ලිඛිතව දන්වා එම විෂමාචාරය හේතුවෙන් ඔහුට දඬුවම් නොපැමිණවීමට හේතු ඇත්නම් සාධාරණ කාලසීමාවක් ඇතුලත ලිඛිතව ඉදිරිපත් කරන ලෙස නියෝග කළ යුතුය. නියමිත කාලසීමාව තුළදී තම නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට චූදිතයා අපොහොසත් වූයේ නම් ඉදිරිපත් කිරීමට නිදහසට කරුණු නොමැති සේ සලකා කටයුතු කරන බවද අදාල ලිපියේ සඳහන් කළ යුතුය.

02.2.3 නියමිත කාලය තුලදී ඔහු විසින් ඉදිරිපත් කරන ලද කරුණු සිදුකර ඇති වරදේ ස්වභාවය අනුව ප්‍රමාණවත් නොවේ යයි හැඟියන්නේ නම් ද, නියමිත කාලයේදී නිදහසට කරුණු ඉදිරිපත් නොකලේ නම් ද, වරදේ ස්වභාවය අනුව දඬුවම් නියම කළ හැක.

02.2.4 කෙසේ වුවද, මෙම ක්‍රියා පටිපාටිය යටතේ වරදකරුවෙකු වන පුද්ගලයෙකු සම්බන්ධයෙන් පැනවිය හැකි උපරිම දඬුවම ඔහුගේ එක් දිනක වැටුපට සමාන දඩයකට වඩා බරපතල නොවිය යුතුය.

**03.** පොදු කරුණු

03.1 චූදිතයන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ අංක 24:2 වගන්තිය(ඇමුණුම 4) නොඉක්මවා කටයුතු කිරීමට සියලු බලධාරීන් වගබලා ගත යුතුය.

03.2 උක්ත කරුණුවලට අමතරව අධිකරණයක් මගින් හෝ ව්‍යවස්ථාපිත බලධරයෙකු(උදා- අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව) විසින් හෝ සිවිල් ආරක්ෂක සාමාජිකයෙකුට විරුද්ධව කටයුතු කරන අවස්ථාවකදී ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ අංක 27 වගන්තිය(ඇමුණුම 5) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ.

03.3 සිවිල් ආරක්ෂක සාමාජිකයෙකුට එරෙහිව නීතිමය කටයුතු කිරීම සඳහා එක් පියවරක් වශයෙන් අදාල පුද්ගලයා පොලිස් හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයෙකු(උදා- අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව) විසින් අත්අඩංගුවට ගෙන ඇති අවස්ථාවක හෝ අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට පෙර රක්ෂිත බන්ධනාගාර ගත කොට ඇති අවස්ථාවක එම කාලසීමාව ආවරණය වන පරිදි අනිවාර්ය නිවාඩු ලබාදිය යුතුය.

03.4 ඔබ විසින් විෂමාචාර සිදුකරන ලද අයවළුන් සම්බන්ධයෙන් ගනු ලබන සියලුම ක්‍රියාමාර්ගවලට අදාල අවසන් බලධරයා විනය බලධරයා වශයෙන් අධ්‍යක්ෂ ජනරාල් වන අතර ඔබ විසින් ගනු ලබන තීරණයන් ක්‍රියාත්මක කිරීමේ, වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ සම්පූර්ණ බලතල අධ්‍යක්ෂ ජනරාල් සතුය.

04. ඉහත දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් නොවැලැක්විය හැකි හේතූන් මත හෝ තම පාලනයෙන් තොරව සිදුවන හේතූන් මත හැර කඩිනමින් ක්‍රියාත්මක නොවන අණදෙන නිලධාරීන් සම්බන්ධයෙන් ද අධ්‍යක්ෂ ජනරාල් විසින් විධිමත්ව සොයා බලා නිසි විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 1

5 වැනි පරිශිෂ්ටය

## ආදර්ශ චෝදනා පත්‍රය

**(මුද්‍රිත නිලධරයකු වෙත විනය බලධරයකු විසින් නිකුත් කරනු ලබන චෝදනා පත්‍රයක ආදර්ශ ආකෘතියකි.)**

ඔබ ..........................................................................................නිලධරයකු වශයෙන් ........................................................................................ සේවය කරමින් සිටියදී ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ ........................ උපලේඛනය යටතට ගැනෙන පහත සඳහන් චෝදනාවන්හි අඩංගු වන රාජකාරී පැහැර හැරීම් හා/හෝ විෂමාචාරයන්හි යෙදීම් යන වැරදි එකක් හෝ කීපයක් හෝ සියල්ලම හෝ සිදුකිරීම හේතුකොට ගෙන ඔබ සේවයෙන් පහ නොකිරීමට හෝ වෙනත් අයුරකින් ඔබට දඬුවම් නොපැමිණවීමට හෝ හේතු ඇතොත් මෙම චෝදනා පත්‍රය ලැබී දින .....................ඇතුළත ........................... ................................................ මගින් මා වෙත ලිඛිතව ඉදිරිපත් කරන ලෙසට ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදය ..........................වැනි උපවගන්තිය යටතේ මෙයින් ඔබට නියෝග කරමි.

**චෝදනා**

(i) ............................................
(ii) ............................................
(iii) ............................................
(iv) ..............................................

02. මෙම චෝදනා සනාථ කිරීම සඳහා පහත සඳහන් සාක්ෂිකරුවන් සහ ලිපි ලේඛන උපයෝගී කරගනු ලැබේ.

**සාක්ෂිකරුවන්**

(i) ....................................
(ii) ....................................
(iii) ........................................

**ලිපිලේඛන**

(i) ....................................
(ii) ....................................
(iii) ........................................
.............................................

03. උක්ත 02 (II) හි දැක්වෙන ලිපිලේඛන පරීක්ෂා කර බැලීමට ඔබට හා/හෝ ඔබගේ ආරක්ෂක නිලධරයාට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ..................................ගේ (දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ තනතුර සඳහන් කරන්න.) පූර්ව අනුමතිය ලබාගෙන ඔහු විසින් නියම කරනු ලබන දිනයක දී ඒවා පරීක්ෂා කර බලා ඔබට අවශ්‍ය වන ලිපිලේඛනවල ඡායා පිටපත් ............................. පූර්ව අනුමතිය මත නියමිත මුදලක් ගෙවා ලබාගත හැක.



51

04. ඔබ වෙනුවෙන් පෙනී සිටීමට ආවරණ නිලධරයෙක් තෝරා ගැනීමට ඔබ අදහස් කරන්නේ නම් ඒ සඳහා ඔහු දරන තනතුර (විශ්‍රාමිකයකු නම් දැරූ) සහ රාජකාරී/පෞද්ගලික ලිපිනය සඳහන් කරමින් ඔහු ඔබගේ ආවරණ නිලධරයා වශයෙන් පෙනී සිටීමට කැමති බවට මේ සමග ඇති ආකෘතිය පුරවා මගේ පූර්ව එකඟත්වය ලබාගත යුතුය. ඔබගේ ආවරණ නිලධරයා රජයේ නිලධරයකු හෝ රජයේ සේවයෙන් විශ්‍රාම ලැබූවකු හෝ විය යුතුය.

05. ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 15 : 7 හා 15 : 8 යන උපවගන්ති අනුව පිළිතුරු සැපයීමට ඔබට පුළුවන. ඔබ නිවැරදිකරු බව පවසා ඔබේ නිදොස් බව සනාථ කිරීමට විධිමත් විනය පරීක්ෂණයක් පවත්වන ලෙස ඉල්ලා සිටින්නේ නම් ආයතන සංග්‍රයේ XLVIII පරිච්ඡේදයේ 19 වන වගන්තියේ දැක්වෙන පරිදි පරීක්ෂණ නිලධරයකු මවිසින් පත්කරනවා ඇත. නීතිඥයකු පරීක්ෂණ නිලධරයා වශයෙන් පත්කරවා ගැනීමට ඔබට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ප්‍රමාණවත් හේතු සාධක ඉදිරිපත් කළ යුතුය.

06. ඔබගේ පිළිතුරු නියමිත කාලසීමාව තුළ දී ..........................(දෙපාර්තමේන්තු ප්‍රධානයා) මගින් මා වෙත ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔබගේ නිදහසට ඉදිරිපත් කිරීමට තරම් කරුණු නොමැති සේ සලකා ක්‍රියා කරන්නෙමි.

07. කරුණාකර මෙම චෝදනා පත්‍රය ලැබුණු බව ................................(දෙපාර්තමේන්තු ප්‍රධානයා) මගින් මා වෙත දන්වා එවන්න.

විනය බලධරයා.

පිටපත් :- 1

2.

ඇමුණුම 2

## රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ පළමුවන උපලේඛනය

(1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අවනත නොවීම.

(2) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම හෝ එසේ කිරීමට ඉඩ හැරීම.

(3) රාජ්‍ය විරෝධී හෝ ත්‍රස්තවාදී හෝ සාපරාධී හෝ කටයුතු සම්බන්ධ වැරදි සිදුකිරීම.

(4) අල්ලස් හෝ දූෂණ හෝ කටයුතු සම්බන්ධයෙන් වැරදි සිදුකිරීම.

(5) රාජකාරී වේලාව තුළ දී හෝ රජයේ කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ මත්පැන් පානය කර සිටීම.

(6) රාජකාරී වේලාව තුළ දී හෝ රජයේ කාර්යාල පරිශ්‍රයක් තුළ දී හෝ විෂ මත්ද්‍රව්‍ය පාවිච්චි කිරීම හෝ ඒවා ළඟ තබා ගැනීම.

(7) රජයේ මුදල් සාවද්‍ය ලෙස හෝ අයථා ලෙස හෝ පරිහරණය කිරීම හෝ වෙනත් අයෙකුට එසේ කිරීමට ඉඩ සැලසීම.

(8) රජයේ සම්පත් සාවද්‍ය ලෙස හෝ අයථා ලෙස හෝ පරිහරණය කිරීම හෝ එසේ කිරීමට ඉඩහැරීම හෝ අවධානයෙන් හෝ අනවධානයෙන් හෝ ඒවා විනාශ වීමට හෝ වටිනාකම අඩුවීමට හෝ ඉඩ හැරීම.

(9) නොසැලකිල්ලෙන් හෝ අනවධානයෙන් හෝ හිතාමතා හෝ රජයේ අයිතිවාසිකම්වලට හානිවන අයුරින් ක්‍රියාකිරීම හෝ එසේ කිරීමට ඉඩහැරීම.

(10) රාජ්‍ය සේවය අපකීර්තියට පත්වන අයුරින් කටයුතු කිරීම.

(11) රජයට හෝ රාජ්‍ය සේවයට හෝ රාජ්‍ය ආයතනයකට හෝ හානිකර විය හැකි අයුරින් තොරතුරු අනාවරණය කිරීම හෝ ඒවායේ පිටපත් නිසි බලධරයකුගේ අවසරයක් නොමැතිව වෙනත් පාර්ශවයක් වෙත ලබාදීම හෝ එසේ කිරීමට ඉඩ සැලසීම.

(12) රාජකාරී ලිපිලේඛන වෙනස් කිරීමට හෝ විකෘති කිරීමට හෝ විනාශ කිරීම හෝ කූට ලේඛන සැකසීමට හෝ කටයුතු කිරීම.

(13) රජයේ නිලධරයකුගේ රාජකාරී කටයුතුවලට බාධාවන අයුරින් හැසිරීම හෝ කටයුතු කිරීම හෝ රජයේ නිලධරයකුට අපහාස කිරීම හෝ අවමන් කිරීම හෝ ශාරීරික පීඩා පැමිණවීම හෝ තර්ජනය කිරීම.

(14) ජ්‍යෙෂ්ඨ නිලධරයකුගේ නීත්‍යානුකූල නියෝග ක්‍රියාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම හෝ අකීකරුවීම හෝ පැහැර හැරීම.

(15) ආයතන සංග්‍රහයේ විධිවිධාන, මුදල් රෙගුලාසි, රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ, භාණ්ඩාගාර චක්‍රලේඛ, දෙපාර්තමේන්තු චක්‍රලේඛ, දෙපාර්තමේන්තු අත්පොත්වල සහ උපදෙස් සංග්‍රහවල විධිවිධාන ද උල්ලංඝනය කිරීම හෝ හිතාමතා හෝ අනවධානයෙන් හෝ නොසලකා හැරීම හෝ මගහැරී යන ආකාරයෙන් කටයුතු කිරීම.

(16) ඉහත දක්වා ඇති වැරදි සිදු කිරීමට අනුබලදීම හෝ සහාය වීම හෝ ඒවා කිරීම සඳහා ඉඩකඩ සලසා දීම.



52

ඇමුණුම 3

## රාජ්‍ය නිලධරයන් විසින් සිදුකළ හැකි වරදවල් සම්බන්ධ දෙවන උපලේඛනය

ඉහත පළමුවන උපලේඛනය යටතට නොවැටෙන නමුත් නිලධරයකුගේ අකාර්යක්ෂමතාවය, අදක්ෂතාවය, අනවධානය, අවංකභාවය නැතිකම, අනිසි හැසිරීම, නොසැලකිල්ල හා අවිනය නිසා සිදුකරනු ලබන වෙනත් වැරදි.

ඇමුණුම 4

## 24 : 2 සුළු දඬුවම්

24:2:1 තරවටු කිරීම (අවවාද කිරීම හෝ තදින් අවවාද කිරීම දඬුවමක් නොවේ)

24:2:2 තදින් තරවටු කිරීම

24:2:3 දෝෂ දර්ශනයට ලක් කිරීම

24:2:4 එක් අවුරුද්දකට වැඩි නොවන කාලයකට වැටුප් වර්ධකය අත්හිටුවීම

24:2:5 එක් අවුරුද්දකට වැඩි නොවන කාලයකට වැටුප් වර්ධකය නතර කිරීම

24:2:6 විනය හේතු පිට කෙරෙන ස්ථාන මාරුවීමක් වශයෙන් නිලධරයාගේ වියදමින් ඔහු වෙනත් ස්ථානයකට මාරු කිරීම

24:2:7 සතියක වැටුපට වැඩි නොවන දඩයක්

24:2:8 ඉහත සඳහන් කරන ලද දඬුවම්වලට වඩා බරපතල නොවන සහ සමාන වන අදාළ විනය බලධරයා විසින් තීරණය කරනු ලබන වෙනත් ආකාරයක දඬුවමක්

**27 අධිකරණයක් විසින් හෝ ව්‍යවස්ථාපිත බලධරයෙකු විසින් හෝ රජයේ නිලධරයෙකුට විරුද්ධව කටයුතු කරන අවස්ථාවකදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය**

27:1 රාජ්‍ය නිලධරයෙකුට විරුද්ධව කරනු ලබන මූලික විමර්ශනයක් මගින් හෝ වෙනත් ආකාරයකින් හෝ ශ්‍රී ලංකාවේ නීතිය යටතේ අධිකරණය විසින් නඩු විභාග කරන දඬුවම් පැමිණවිය යුතු සාපරාධී වරදක් එම රාජ්‍ය නිලධරයා විසින් සිදුකර ඇති බව ඉදිරිපත්ව ඇති සාධක හෝ සාක්ෂි හෝ මත බැලූ බැල්මට පෙනී යන අවස්ථාවකදී එම නිලධරයාට විරුද්ධව ශ්‍රී ලංකාවේ පවතින නීතිය යටතේ නිසි පියවර ගැනීම සඳහා එම නිලධරයාගේ විනය බලධරයා හෝ ආයතන ප්‍රධානියා හෝ විසින් ඒ පිළිබඳව පොලිස් දෙපාර්තමේන්තුව වෙත හෝ අදාළ ව්‍යවස්ථාපිත බලධරයෙකු වෙත හෝ අප්‍රමාදව දන්වා සිටීමට ක්‍රියා කළ යුතුය.

27:2 රාජ්‍ය නිලධරයෙකුට විරුද්ධව කරනු ලබන මූලික විමර්ශනයක් මගින් හෝ වෙනත් කුමන ආකාරයකින් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා හෝ සම්බන්ධ වන වරදක් එම රාජ්‍ය නිලධරයා විසින් සිදු කර ඇති බව ඉදිරිපත්ව ඇති සාධක හෝ සාක්ෂි හෝ මත බැලූ බැල්මට පෙනී යන අවස්ථාවක දී එම නිලධරයාට විරුද්ධව අදාළ නීතිය යටතේ නිසි පියවර ගැනීම සඳහා එම නිලධරයාගේ විනය බලධරයා හෝ ආයතන ප්‍රධානියා හෝ විසින් ඒ පිළිබඳව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත හෝ එවැනි චෝදනාවක් විමර්ශනය කිරීමට නීතියෙන් බලය පැවරී ඇති වෙනත් ව්‍යවස්ථාපිත බලධරයෙකු වෙත හෝ අප්‍රමාදව දන්වා සිටීමට ක්‍රියා කළ යුතුය.

27:3 රාජ්‍ය නිලධරයෙකුට විරුද්ධව කරනු ලබන මූලික විමර්ශනයක් මගින් හෝ වෙනත් කුමන ආකාරයකින් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය විසින් පනවන ලද පනතක කිසියම් විධිවිධානයක් උල්ලංඝනය කිරීම පිළිබඳව දඬුවම් පැමිණවීමට නිසි බලයලත් බලධරයෙකු හෝ ආයතනයක් හෝ (උදා- රේගු අධ්‍යක්ෂ ජනරාල්, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්) මගින් දඬුවම් පැමිණවිය හැකි යම් වරදක් එම රාජ්‍ය නිලධරයා විසින් සිදුකර ඇති බව ඉදිරිපත්ව ඇති සාධක හෝ සාක්ෂි හෝ මත බැලූ බැල්මට පෙනී යන අවස්ථාවක දී එම නිලධරයාට විරුද්ධව අදාළ නීතිය යටතේ නිසි පියවර ගැනීම සඳහා එම නිලධරයාගේ විනය බලධරයා හෝ ආයතන ප්‍රධානියා හෝ විසින් ඒ පිළිබඳව අදාළ ව්‍යවස්ථාපිත බලධරයා හෝ ආයතනය හෝ වෙත අප්‍රමාදව දන්වා සිටීමට ක්‍රියා කළ යුතුය.

27:4 මූලික විමර්ශනයක් පවත්වන අවස්ථාවකදී හෝ පැවැත්වීමට තරම් සාධක ඉදිරිපත්ව ඇති අවස්ථාවකදී හෝ උක්ත 27:1, 27:2 හා 27:3 උප වගන්ති ප්‍රකාරව අදාළ බලධරයන් වෙත තොරතුරු දන්වා යැවීමෙන් පසුව වුව ද කරගෙන යනු ලබන හෝ කිරීමට අපේක්ෂිත හෝ මූලික විමර්ශන කටයුතු ප්‍රබල හේතුවක් හෝ නොවැළැක්විය හැකි බාධාවක් හෝ නොමැති අවස්ථාවකදී අදාළ වූ මූලික විමර්ශනය අත්හිටුවීම හෝ කල්දැමීම හෝ සිදු නොකළ යුත්තේය. මූලික විමර්ශනය අත්හිටුවන්නේ නම්, එසේ අත්හිටුවීමට හේතු වූ ප්‍රබල හේතුව හෝ බාධකය හෝ ඉවත් වූ වහාම එම මූලික විමර්ශනය නැවත පවත්වා අවසන් කළ යුතුය.

27:5 උක්ත 27:1, 27:2 හා 27:3 උප වගන්ති ප්‍රකාරව නීතිමය කටයුතු කිරීම සඳහා අදාළ බලධරයන් වෙත දන්වනු ලැබ ඇති කල්හි එම බලධරයන් විසින් ඔවුන්ගේ විමර්ශන කටයුතු හා නීති කෘත්‍යයන් සඳහා අවශ්‍ය ලිපිලේඛන, අදාළ භාණ්ඩයන් හා අදාළ වන අනෙකුත් දේවල් අදාළ ආයතන ප්‍රධානියාගෙන් හෝ විනය බලධරයාගෙන් හෝ ඉල්ලා සිටි විටක දී ඒවා ඉල්ලා සිටි බලධරයන් වෙත භාරදිය යුතු වන්නේය.

27:6 උක්ත 27:5 උප වගන්තිය යටතේ තම විමර්ශන කටයුතුවලට හෝ නීති කෘත්‍යයන් සඳහා හෝ අදාළ වන ලිපි ලේඛනයන් අදාළ බලධරයා වෙත භාරදෙනු ලබන අවස්ථාවකදී අදාළ චූදිත නිලධරයාට විරුද්ධව දෙපාර්තමේන්තුව මගින් ගනු ලැබිය හැකි විනය ක්‍රියාමාර්ගයන් සඳහා අවශ්‍ය වන ලිපිලේඛනවල සහතික කළ ඡායා පිටපත් අදාළ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා හෝ මාණ්ඩලික නිලධරයෙකු හෝ විසින් සහතික කර තබාගත යුත්තේය. එසේ රඳවාගනු ලබන ලිපිලේඛනවල සහතික කළ පිටපත් නිලධරයාට විරුද්ධව කරනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයක දී සම්පූර්ණයෙන් පිළිගත හැකි ලියවිලි වශයෙන් සැලකිය යුතු වන්නේය.

27:7 රජයේ නිලධරයෙකුට විරුද්ධව අධිකරණ කටයුතු ආරම්භ කිරීමේ එක් පියවරක් වශයෙන් අදාළ නිලධරයා පොලිස් හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයෙකු හෝ විසින් අත් අඩංගුවට ගෙන ඇති අවස්ථාවකදී හෝ අධිකරණය ඉදිරියේ නීති කෘත්‍යයන් ආරම්භ කිරීමට පෙර රක්ෂිත බන්ධනාගාර

ගතකොට ඇති අවස්ථාවක දී හෝ එම නිලධරයාට එම කාලය ආවරණය වන පරිදි අනිවාර්ය නිවාඩු ලබාදිය යුත්තේය.

27:8 පොලිස් දෙපාර්තමේන්තුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත බලධරයෙකු හෝ විසින් අත්අඩංගුවට ගනු ලැබූ රජයේ නිලධරයෙකු එම අත්අඩංගුවෙන් නිදහස් කරනු ලැබ ඇති විටකදී ඔහු නැවත සේවයේ පිහිටුවිය යුතුය. එසේ වුවද එම නැවත සේවයේ පිහිටුවීම මගින් විනය බලධරයා විසින් පැවැත්වීමට නියමිතව ඇති විධිමත් විනය පරීක්ෂණයට බාධාවක් ඇති වන්නේ නම් අදාළ චූදිත නිලධරයා නැවත සේවයේ නොපිහිටුවා ඔහුගේ වැඩ තහනම් කළ යුතුය.

27:9 නඩු පැවරීමට පෙරාතුව රක්ෂිත බන්ධනාගාර ගත කොට ඇති නිලධරයෙකු ඇප පිට නිදහස් කර ඇති අවස්ථාවකදී එම නිලධරයා නැවත රාජ්‍ය සේවයේ පිහිටුවීම රජයේ සේවයේ යහපතට අහිතකර නොවන්නේ යැයි විනය බලධරයා නිගමනය කරන අවස්ථාවකදී ඔහු නැවත සේයේ පිහිටුවිය යුතුය. ඔහු නැවත ශේවයේ පිහිටුවීම රජයේ සේවයේ යහපතට අහිතකර වන්නේ යයි විනය බලධරයා සෑහීමකට පත්වන්නේ නම් ඔහු තවදුරටත් අනිවාර්ය නිවාඩු මත තැබිය යුත්තේය. එසේම නිලධරයාට විරුද්ධව විධිමත් විනය ක්‍රියා පටිපාටියක් ආරම්භ කිරීමට විනය බලධරයා තීරණය කර ඇති අවස්ථාවකදී සේවයේ පිහිටුවීම එසේ පවත්වනු ලැබීමට අපේක්ෂිත විධිමත් විනය ක්‍රියා පටිපාටියට බාධාවක් වන්නේ නම් අවස්ථාවෝචිත පරිදි ඔහුගේ වැඩ තහනම් කළ යුතුය.

27:10 සාපරාධී වරදක් සම්බන්ධයෙන් හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා සම්බන්ධයෙන් හෝ රජයේ නිලධරයෙකුට විරුද්ධව අධිකරණයේ නඩු පවරා ඇති අවස්ථාවකදී නියමිත බලධරයා විසින් වහාම ක්‍රියාත්මක වන පරිදි අදාළ නිලධරයාගේ වැඩ තහනම් කළ යුත්තේය.

27:11 යම් වරදක් සම්බන්ධයෙන් රජයේ නිලධරයෙකුට විරුද්ධව අධිකරණයේ නීති කෘත්‍යයක් පවත්වාගෙන යමින් තිබියදී වුවද එම වරද මෙම සංග්‍රහය යටතේ ගැනෙන වරදක් වන කල්හි අදාළ විනය බලධරයා විසින් නිලධරයාට විරුද්ධව අධිකරණ කටයුතුවලට ස්වාධීන වශයෙන් දෙපාර්තමේන්තු විනය පරීක්ෂණයක් ද පවත්වාගෙන යා යුත්තේය. දෙපාර්තමේන්තු විනය ක්‍රියා පටිපාටිය අත්හිටුවීම හෝ කල් දැමීම හෝ කළ යුතු වන්නේ එය පවත්වාගෙන යාම සඳහා ප්‍රබල බාධාවක් හෝ නොවැළැක්විය හැකි හේතුවක් හෝ ඇතිවන අවස්ථාවකදී පමණකි.

27:12 උක්ත 27:11 උප වගන්තිය ප්‍රකාරව නිලධරයෙකුට විරුද්ධව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය අවසන් වීමෙන් පසු අදාළ විනය නියෝගය නිකුත් කිරීම සඳහා නිලධරයාට විරුද්ධව කරගෙන යනු ලබන අධිකරණ ක්‍රියාමාර්ගය අවසන් වී නොතිබීම කිසිදු බාධාවක් නොවන්නේය.

27:13 උක්ත 27:11 උප වගන්තිය ප්‍රකාරව නිලධරයෙකුට විරුද්ධව පවත්වනු ලබන අධිකරණමය ක්‍රියාමාර්ගය අවසන්වීමෙන් පසු තීන්දුව ලබා දෙන අවස්ථාව වන විට එම නිලධරයාට විරුද්ධව පවත්වනු ලැබූ දෙපාර්තමේන්තු විනය පරීක්ෂණය අවසන් වී නොතිබුණහොත් විනය පරීක්ෂණය තවදුරටත් පවත්වාගෙන යාමට ප්‍රබල බාධාවක් හෝ නොවැළැක්විය හැකි හේතුවක් හෝ පවතින්නේ නම් හැර අධිකරණ තීරණය විනය පරීක්ෂණයට බලපෑමක් නොකරන්නේ යැයි සලකා විධිමත් විනය පරීක්ෂණය අවසාන වන තෙක් පවත්වාගෙන ගොස් විනය නියෝගය නිකුත් කළ යුත්තේය.

27:14 එකම සිදුවීමක් හෝ සිදුවීම් මාලාවක් හෝ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු පරීක්ෂණයක් මගින් නිදහස් කොට ඇති නිලධරයෙකු එම චෝදනා යටතේ පැවති අධිකරණ ක්‍රියාමාර්ගයකින් වැරදිකරු කොට ඇති අවස්ථාවක දී ඔහුට විරුද්ධව මෙම සංග්‍රහයේ 28 වන වගන්තිය යටතේ කටයුතු කිරීම සඳහා චූදිත නිලධරයා විනය පරීක්ෂණයෙන් නිදහස්වීම කිසිදු බාධාවක් නොවන්නේය.

27:15 එකම සිදුවීමක් හෝ සිදුවීම් මාලාවක් හෝ සම්බන්ධයෙන් අධිකරණමය නඩු විභාගයක් සහ දෙපාර්තමේන්තුමය විනය පරීක්ෂණයක් පැවැත්වූ අවස්ථාවකදී, දෙපාර්තමේන්තු විනය පරීක්ෂණයෙන් අදාළ නිලධරයා වරදකරු ලෙස නිගමනය කර ඇති අවස්ථාවකදී ඒ පිළිබඳ අධිකරණය ඉදිරියේ පැවති නඩු විභාගයෙන් අදාළ නිලධරයා නිදහස් කරනු ලැබීම දෙපාර්තමේන්තු විනය පරීක්ෂණයකින් හෙළිදරව් වූ කරුණු මත නිකුත් කරනු ලැබූ විනය නියෝගය ක්‍රියාත්මක කිරීමට කිසිදු බාධාවක් නොවිය යුත්තේය.